ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 නොවැම්බර් 11 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 නොවැම්බර්

ආර්ථික වර්ධනය තවදුරටත් ඉහළ නැංවීම අරමුණු කොටගෙන අපේක්ෂිත පරිදි මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග, ප්‍රධාන ආර්ථික විචල්‍යයන් මත අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර දෙමින් සිටියි. මෑත කාලයේදී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම හේතුකොට ගෙන කෙටිකාලීන පොලී අනුපාතික ඉක්මනින් පහත වැටුණු නමුත්, මධ්‍යකාලීන හා දිගුකාලීන ණය පොලී අනුපාතික තවදුරටත් පහත දැමීම සඳහා ප්‍රමාණවත් අවකාශ වාණිජ බැංකු සතුව පවතින අතර එමගින් තවදුරටත් පෞද්ගලික අංශයේ ආයෝජන වර්ධනයවීම මෙන්ම පෞද්ගලික අංශය වෙත ගලා යන ණය ප්‍රමාණය යහපත් මට්ටමකට වැඩිවීම ද සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශුද්ධ විදේශීය වත්කම්හි (NFA) සිදුවූ සැලකියයුතු ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය පසුගිය මාසයේ පැවති සියයට 15.3 ක සිට 2013 සැප්තැම්බර් මාසයේදී සියයට 16.3 දක්වා වැඩි විය. ආයෝජන මණ්ඩල (BOI) සමාගම් විසින් අක්වෙරළ බැංකු ඒකක වෙත කළ ණය පියවීම්හි ප්‍රතිඵලයක් ලෙස 2013 සැප්තැම්බර් මාසයේදී පෞද්ගලික අංශය විසින් ලබාගත් ණයෙහි වර්ධන වේගය සියයට 7.6 ක් දක්වා මන්දගාමී විය. එනමුත්, වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකක මගින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණය, ණය ගැනීමේ වේගය වැඩිවීම පිළිබඳව සංඥා කරමින් 2013 සැප්තැම්බර් මාසයේදී රුපියල් බිලියන 20 කට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගියේය. මේ තත්ත්වය තුළ, 2013 සැප්තැම්බර් මාසය තුළ දී රාජ්‍ය අංශය බැංකු අංශය මත යැපීම පහළයාම පිළිබිඹු කරමින් බැංකු අංශයෙන් රජය සහ රාජ්‍ය සංස්ථාවන් ලබාගත් ශුද්ධ ණය

ප්‍රමාණය පිළිවෙළින් රුපියල් බිලියන 50.2 කින් සහ රුපියල් බිලියන 25 කින් අඩුවීම දිරිගන්වනසුළු සලකුණක් විය.

මේ අතර, උද්ධමනය 2009 පෙබරවාරි මාසයේ සිට 57 වන අනුගාමී මාසයටත් පවතිමින්, 2013 ඔක්තෝබර් මාසයේ දී ද තවදුරටත් මැදි තනි අංකයක් වාර්තා කළ අතර මෑතකාලීන උද්ධමන අගයන් තුළින්, උද්ධමනය උච්චාවචනයන් සමනය වීම පිළිබිඹු කෙරේ. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය, ඇතැම් ආහාර අයිතමයන්හි මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන, පෙර මාසයේ පැවති සියයට 6.2 (වාර්ෂික ලක්ෂ්‍යමය) සිට 2013 ඔක්තෝබර් මාසය තුළ දී සියයට 6.7 ක් දක්වා වූ සුළු වර්ධනයක් පෙන්නුම් කළේය. මේ අතර, මූලික උද්ධමනය නොකඩවාම පහළ ගිය අතර 2013 ඔක්තෝබර් මාසයේ දී එහි අඩුම අගය වූ සියයට 2.6 ක් වාර්තා විය. ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල ගණන් අඩුවීම, දේශීය සැපයුම් අංශයේ පීඩනයන් අඩුවීම මෙන්ම ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනාත්මක පීඩන මනාව පාලනය වී තිබීම හේතුකොට ගෙන ඉදිරියේදී උද්ධමනය අපේක්ෂාවන් අඛණ්ඩවම පහළ මට්ටමක පවතිනු ඇත. මෙම පසුබිම තුළ වර්තමාන පුරෝකථනයන්ට අනුව, 2014 වසර මුළුල්ලේම උද්ධමනය මැදි තනි අංකයක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වසරේ ඉතිරි කාලය තුළ දී ලැබිය හැකි අපනයන ආදායම්හි තිරසාර වර්ධනයක් පිළිබඳ අපේක්ෂාවන් තවදුරටත් තීව්‍ර කරමින්, විදේශීය අංශයේ අපනයන තවදුරටත් යහපත් තත්ත්වයකට පත්වෙමින් පවතී. මේ අතර, මෑත මාස කිහිපය තුළ දී ආනයනවල සුළු වර්ධනයක් දක්නට ලැබුණ ද, 2013 වසරේ වෙළෙඳ හිඟය තවදුරටත් වසර තුළ යම්තරමකින් අඩු කරමින් ආනයන පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2013 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද ගෙවුම් තුලනයෙහි අතිරික්තය එ.ජ.ඩොලර් මිලියන 700 ට බොහෝදුරට අනුකූල වෙමින් 2013 ඔක්තෝබර් 31 දින වන විට ගෙවුම් තුලනය එ.ජ.ඩොලර් මිලියන 749 ක අතිරික්තයක් වාර්තා කළේය. මේ අතර, 2013 ඔක්තෝබර් අවසන් වන විට දළ නිල සංචිත, ආනයනික මාස 4.5 ට සමාන වෙමින් එ.ජ.ඩොලර් බිලියන 7.1 ක් බවට පත් වූ අතර, කලාපයේ අනෙකුත් රටවල විනිමය අනුපාතිකයන් සමඟ සසඳන කල එ.ජ.ඩොලරයට සාපේක්ෂව දේශීය විනිමය අනුපාතය වඩා ශක්තිමත්භාවයක් පෙන්නුම් කළේය. ඉදිරියේදී, භාණ්ඩ හා සේවා අපනයනයන් සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වැඩිවීම නිසා විදේශ විනිමය ලැබීම් ඉහළයාම වර්තන ගිණුමේ හිඟය පියවීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම පිළිබඳ අපේක්ෂාවන් ඉහළ නංවමින් දියුණු ආර්ථිකයන්ගේ මෑතකාලයේ දක්නට ලැබූ ධනාත්මක වර්ධනයන් මූල්‍ය ගිණුම වෙත වූ විදේශීය ප්‍රවාහ ලැබීම් ඉහළ නංවනු ඇති අතර, එමඟින් කෙටිකාලයේදී විදේශීය සංචිත තවදුරටත් වර්ධනය කරමින් ගෙවුම් තුලනය වඩාත් සවිමත් වනු ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2013 නොවැම්බර් මස 08 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී දැනට පවතිනා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසුයැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර, ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 6.50 ක් සහ සියයට 8.50 ක් ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථාකාලයේදී ප්‍රකාශයට පත්කරනු ඇත.